(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 129.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2026 පෙබරවාරි 06 සිකුරාදා පූ. භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය,** ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත ජයවීර මහතා,** ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරවින්ද සෙනරත් මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිනිඳු සමන් හෙන්නායක මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු රොෂාන් අක්මීමන මහතා

ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා

ගරු අබූබකර් අතම්බාවා මහතා

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා

ගරු ජේ.සී. අලවතුවල මහතා

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු ඕෂානි උමංගා මහත්මිය

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු දීප්ති වාසලගේ මහත්මිය

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**

**ගරු කංචන වැලිපිටිය මහතා**

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**

**ගරු රුවන් විජේවීර මහතා**

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**

**ගරු අතුල වෙලඳගොඩ මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**

**ගරු තිළිණ සමරකෝන් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදන කරන ලදී:—

I

“ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද ‘පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ)’ නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

මෙම පනත් කෙටුම්පතෙහි කිසිදු විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කිසිදු විධිවිධානයකට අනනුකූල නොවන බවත් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සරල බහුතරයෙන් සම්මත කළ හැකි බවත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.”

II

“2026 පෙබරවාරි 03 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් හතරට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ‘පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ’ නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක් 2026 පෙබරවාරි 05 වැනි දින මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.”

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 44, 123, 124, 125, 126, 126ආ, 128, 132, 132අ සහ 231 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 නොවැම්බර් 17 දිනැති අංක 2463/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 126 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 දෙසැම්බර් 17 දිනැති අංක 2467/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

ඉදිරිපත් කර, එම නියෝග ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති වෙනුවෙන්, එහි සාමාජික මන්ත්‍රී, ගරු නිශාන්ත ජයවීර මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) කටුවන, තල්වත්ත, 'ජයමිණි' යන ලිපිනයෙහි පදිංචි එච්.ඩබ්ලිව්. සමන් මහතාගෙන් ලැබුණු 2025.08.17 දිනැති පෙත්සම;

(ii) වලස්මුල්ල, රාජපුරගොඩ යන ලිපිනයෙහි පදිංචි ආර්.පී. මල්හාමි මහතාගෙන් ලැබුණු 2025.06.30 දිනැති පෙත්සම; සහ

(iii) තිස්සමහාරාම, යෝධකණ්ඩිය, උද්දකන්දර පාර, අංක. 198 දරන ස්ථානයෙහි පදිංචි රොෂාන් පුෂ්පකුමාර වීරකෝන් මහතාගෙන් ලැබුණු 2025.06.02 දිනැති පෙත්සම

ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) කඹුරුපිටිය, ගතාර - බටහිර, ‘සුනිල් සෙවණ’, අංක 187 දරන ස්ථානයෙහි පදිංචි එච්.ජී. අමාලි තාරකා මහත්මියගෙන් ලැබුණු 2025.07.27 දිනැති පෙත්සම;

(ii) ගන්දර, දෙල්ගල්ල, නුරුව යන ලිපිනයෙහි පදිංචි පී.කේ. රුවන්ති මහත්මියගෙන් ලැබුණු 2025.07.20 දිනැති පෙත්සම; සහ

(iii) නාකුළුගමුව, දියඇල, ‘විජය’ යන ලිපිනයෙහි පදිංචි ආර්. ශ්‍රීමාලි විජයංගා මහත්මියගෙන් ලැබුණු 2025.07.20 දිනැති පෙත්සම

ගරු චතුර ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) බුත්පිටිය, මල්වතුහිරිපිටිය, අංක. 206/2 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ආර්.එම්.එච්.බී. රත්නායක මහතාගෙන් ලැබුණු 2025.09.23 දිනැති පෙත්සම;

(ii) රාගම, කුරුකුලාව, ශාන්ත සෙබස්තියන් මාවත, අංක 244/4/4 දරන ස්ථානයෙහි පදිංචි අශෝක උපසේන මහතාගෙන් ලැබුණු 2025.09.12 දිනැති පෙත්සම; සහ

(iii) කැලණිය, දළුගම, නුවර පාර, අංක 325 සී දරන ස්ථානයෙහි පදිංචි එන්.එච්. කරන්දෙණිය මහතාගෙන් ලැබුණු 2025.11.06 දිනැති පෙත්සම

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— අද දින ආණ්ඩුවේ වැඩකටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 80 සහ 81 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. වරප්‍රසාද:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩවී ඇති බවට කථානායකවරයා විසින් 2026 පෙබරවාරි 05 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2026 ජනවාරි 28 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(පූ.භා. 11.01 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.00 ට ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.)

"ගරු වානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි බලශක්ති අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.02 ට ගරු වානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.02 ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 5.26 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 106; විරුද්ධව 02; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය පස්දෙනෙකු (105) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 002. Sunil Handunnetti | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Susil Ranasinghe | Yes |
| G 025. Nihal Galappaththi | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 027. Namal Karunaratne | Yes |
| G 029. Gamagedara Dissanayake | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 035. Eranga Gunasekara | Yes |
| G 040. Anton Jayakody | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 042. Sundaralingam Pradeep | Yes |
| G 043. Ruwan Ranasinghe | Yes |

| | |
|---|---|
| G 044. Muneer Mulaffer | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 057. Dinindu Saman | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Ashoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Najith Indika | Yes |
| G 063. Lakmali Hemachandra | Yes |
| G 064. Samanmali Gunasingha | Yes |
| G 070. Sagarika Athauda | Yes |
| G 071. Roshan Akmeemana | Yes |
| G 072. U. P. Abeywickrama | Yes |
| G 073. L.M. Abeywickrama | Yes |
| G 074. M.K.M. Aslam | Yes |
| G 075. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 076. Oshani Umanga | Yes |
| G 077. Krishnan Kalaichelvi | Yes |
| G 080. Chaminda Lalith Kumara | Yes |
| G 082. Nilanthi Kottahachchi | Yes |
| G 083. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 084. Lasith Bhashana Gamage | Yes |
| G 086. Nilusha Lakmali Gamage | Yes |
| G 088. Ajith Gihan | Yes |
| G 089. Jagath Gunawardana | Yes |
| G 090. Aboobucker Athambawa | Yes |
| G 091. Ruwanthilaka Jayakody | Yes |
| G 092. Thushari Jayasingha | Yes |
| G 093. T.K. Jayasundara | Yes |
| G 094. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Anushka Thilakarathne | Yes |
| G 099. Chandana Thennakoon | Yes |

| | |
|---|---|
| G 103. Susantha Dodawatta | Yes |
| G 104. Susantha Kumara Nawarathna | Yes |
| G 105. Sena Nanayakkara | Yes |
| G 106. Aruna Panagoda | Yes |
| G 107. Nimal Palihena | Yes |
| G 108. Nishantha Perera | Yes |
| G 109. Stepni Fernando | Yes |
| G 110. Kanthasamy Prabu | Yes |
| G 111. Lal Premanath | Yes |
| G 112. Nanda Bandara | Yes |
| G 113. Padmasiri Bandara | Yes |
| G 114. Ravindra Bandara | Yes |
| G 115. Sudath Balagalla | Yes |
| G 116. Sri Bavanandarajah | Yes |
| O 014. Amirthanathan Adaikkalanathan | No |
| O 015. G.G. Ponnambalam | No |
| O 066. Wijesiri Basnayake | Yes |
| O 067. S. Sandaruwan Madarasinghe | Yes |
| O 068. Prageeth Madhuranga | Yes |
| O 070. Ruwan Mapalagama | Yes |
| O 071. Nandana Millagala | Yes |
| O 081. Danushka Ranganath | Yes |
| O 082. Sanjeewa Ranasingha | Yes |
| O 083. Sunil Rathnasiri | Yes |
| O 084. Manjula Sugath Rathnayaka | Yes |
| O 089. Deepthi Wasalage | Yes |
| O 090. Kanchana Welipitiya | Yes |
| O 091. R. G. Wijerathna | Yes |
| O 092. Nishantha Samaraweera | Yes |
| O 093. Priyantha Wijerathna | Yes |
| O 094. Ruwan Wijeweera | Yes |
| O 095. Darmapriya Wijesinghe | Yes |
| O 099. Thilina Samarakoon | Yes |
| O 101. Dewananda Suraweera | Yes |
| O 102. Chandana Sooriyaarachchi | Yes |
| O 103. G.D. Sooriyabandara | Yes |
| O 105. Janaka Senarathna | Yes |
| O 106. Chandima Hettiaratchi | Yes |
| O 107. Champika Hettiarachchi | Yes |
| O 108. Dinesh Hemantha | Yes |

| | |
|---|---|
| O 109. Geetha Herath | Yes |
| O 111. Muhammad Faizal | Yes |
| O 112. Ashoka Gunasena | Yes |
| O 113. Nandana Pathmakumara | Yes |
| O 115. Samantha Ranasingha | Yes |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය විසින් පහත සඳහන් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගෙන් (01) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| R. M. Gamini Ratnayaka | Yes |

**10. අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2026 ජනවාරි 28 දිනැති අංක 2473/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2026.02.03 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබූයෙන්, අ.භා. 6.29 ට කථානායකවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2026 පෙබරවාරි 17 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.